# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,903 - 2015 පෙබරවාරි මස 20 වැනි සිකුරාදා - 2015.02.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 498 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 518 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය*** **පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 මාර්තු මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 පෙබරවාරි මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## ගිරිබාව ප්‍රාදේශීය සභාව

තනතුරු ඇබෑර්තු

**වයඹ පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

ගිරිබාව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති වයඹ පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත සම්පූර්ණ කර ලේකම්, ගිරිබාව ප්‍රාදේශීය සභාව, තඹුත්ත යන ලිපිනයට 2015.03.06 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | රියදුරු ප්‍රාථමික - ශිල්පීය III ශ්‍රේණිය | 01 | ජී.එල්. 3-2006-ඒ- රු. 12,470 - 10 x 130- 10 x 145 - 10 x 160 - 12 x 170 - 18,860 | (සටහන 1 බලන්න) |
| 02. | බර වාහන ක්‍රියාකරු ප්‍රාථමික - ශිල්පීය III ශ්‍රේණිය | 01 | ජී.එල්. 3-2006-ඒ- රු. 12,470 - 10 x 130- 10 x 145 - 10 x 160 - 12 x 170 - 18,860 | (සටහන 2 බලන්න) |
| 03. | විදුලි කාර්මික ප්‍රාථමික - අර්ධ ශිල්පීය III ශ්‍රේණිය | 01 | ජී.එල්. 2-2006-ඒ- රු. 12,210 - 10 x 130- 10 x 145 - 10 x 160 - 12 x 170 - 18,600 | (සටහන 3 බලන්න) |
| 04. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු ප්‍රාථමික - ශිල්පීය නොවන III ශ්‍රේණිය | 01 | ජී.එල්. 1-2006-ඒ- රු. 11,730 - 10 x 120- 10 x 130 - 10 x 145 - 12 x 160 - 17,600 | (සටහන 4 බලන්න) |
| 05. | සෞඛ්‍ය කම්කරු ප්‍රාථමික - ශිල්පීය නොවන III ශ්‍රේණිය | 07 | ජී.එල්. 1-2006-ඒ- රු. 11,730 - 10 x 120- 10 x 130 - 10 x 145 - 12 x 160 - 17,600 | (සටහන 5 බලන්න) |

*සටහන 01* :

රියදුරු තනතුර සහ බර වාහන ක්‍රියාකරු තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම්

*බාහිර අයදුම්කරුවන් සඳහා.-* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 05ක් සමත් විය යුතුය.

*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා.-* රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම.

*ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා.-* තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32කට බඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (A පන්තියේ රියදුරු බලපත්‍රයක්)

*පළපුරුද්ද.-* වාහන රියදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. (සේවා සහතික මගින් සනාථ කළ යුතුය.)

*සටහන 02* :

බර වාහන ක්‍රියාකරු තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම්

*බාහිර අයදුම්කරුවන් සඳහා.-* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 05ක් සමත් විය යුතුය

*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා.-* රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම.

*ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා.-* තාර බර හොන්ඩර 34ට වැඩි බව මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (A පන්තියේ රියදුරු බලපත්‍රයක්)

*සටහන 03 :*

විදුලි කාර්මික තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම්

*බාහිර අයදුම්කරුවන් සඳහා.-* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)

*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා.-* රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම

*ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා.-* රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ වෘත්තීය පුහුණු ආයතනයක හෝ තෘතීය ආයතනය විසින් පිළිගත් ආයතනයක විදුලි කාර්මික ශිල්පය පිළිබඳ පුහුණු සහතිකය.

*පළපුරුද්ද.-* වෘත්තියට අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක රාජ්‍ය සංස්ථා/මණ්ඩල/ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් රජය පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් වසර 02කට වැඩි කාලයක් සේවය කර තිබීම. (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)

*සටහන 04 :*

වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම්

*බාහිර අයදුම්කරුවන් සඳහා.-* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)

*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා.-* රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම

*සටහන 05 :*

සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම්

රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම.

02. *බඳවා ගැනීමේ ක්‍රමය.-* අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

03. *සේවා නියුක්ත කරලීමේ කොන්දේසි*

* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
* වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
* තෝරා ගනු ලබන්නන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේදී සේවය ස්ථිර කරනු ලැබේ.

04. වෙන් පොදු කොන්දේසි

* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

* අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.

* විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය. තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

* දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටත් පිරිසෙයින් වසර 03කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)

* දැනටමත් ගිරිබාව ප්‍රාදේශීය සභාවේ ස්ථිර, අනියම්, ආදේශක, දීමනා, කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු වූවන් කෙරෙහි ප්‍රමුඛතාවය දක්වනු ලැබේ. (සතුටුදායක සේවා කාලයක් තිබූ බවට සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)

* රජයේ හෝ පළත් රාජ්‍ය සේවයේ පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

* රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් අයදුම්පත් භාරගැනීමේ අවසන දිනට පූර්වාසන්න වන අවුරුදු 05ක කාලය තුළ වරදකට (අවවාද කිරීම් හැර) දඬුවමක් ලබා නැත්තා වූ ද, මෙම කාලය තුළ යෙදුණු වැටුප් වර්ධක නිශ්චිත දිනට ලබා ගත්තා වූ ද, සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය. තෝරා ගනු ලැබුවහොත් ඔවුන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට තවදුරටත් දායක විය යුතුය.

* මෙම බඳවා ගැනීම කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට, රජයේ දෙපාර්තමේන්තු නියෝග වලටද, වයම පළාත් සභාව හෝ ගිරිබාව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

05. *අයදුම් කළ යුතු ආකාරය .-* මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2015.03.06 දින හෝ එදිනට පෙර ලැබෙන සේ 'ලේකම්, ගිරිබාව ප්‍රාදේශීය සභාව, තඹුත්ත' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ, අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය, පළාත් රාජය සේවයේ අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. අයදුම්පත ඒ-4 ප්‍රමාණයේ කඩදාසිවල ඉදිරිපත් කළ යුතුය.) අසම්පූර්ණ හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතුය.

* උප්පැන්න සහතිකය ;
* අධ්‍යාපන සහතික ;
* පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් සහතිකය ;
* මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් ; (එක් සහතිකයක් ග්‍රාම නිළධාරීගෙන් විය යුතුය.)
* වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික ;
* සෙවා සහතික (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණි).

07. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල ගිරිබාව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය. දෙමළ, ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇතිවුවහොත් සිංහල අර්ථය පුමුඛ කොට ගත යුතුය.

ඩී. ඒ. දිසානායක,
ලේකම්,
ගිරිබාව ප්‍රාදේශීය සභාව.

2015 පෙබරවාරි මස 06 වැනි දින,
ගිරිබාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

අයදුම්පත්‍රය

ගිරිබාව ප්‍රාදේශීය සභාව

................................ තනතුර සඳහා අයදුම්පත්‍රය

01. මුලකුරු සමග නම : ————— ;

මුලකුරු වලින් හැඳින්වෙන නම් : ————— ;

02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ————— ;

03. ස්ථිර පදිංචි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : ————— ;

02. ස්ථිර ලිපිනය : ————— ;

04. ස්ත්‍රී/පුරුෂ භාවය : ————— ;

05. උපන් දිනය : ————— ;

07. ................................ දිනට වයස :
අවුරුදු : ————— ; මාස : ————— ; දින : ————— ;

08. ජාතික හැඳුනුම්පත් අංකය : ————— ;

09. විවාහක/අවිවාහක බව : ————— ;

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන්ද ? : ————— ;

11. අධ්‍යාපන සුදුසුකම් : ————— ;
(සමත් වූ විභාග පිළිබඳ විස්තර)

12. වෘත්තිමය සුදුසුකම් හා පළපුරුද්ද : ————— ;

13. ඔබ දැනටමත් මෙම ආදේශක සේවය කරන්නේ නම් සේවා කාලය සහ විස්තර : ————— ;

එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම ද යන වග :

14. මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත් තෝරා ගැනීමෙන් පසු දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් බව දනිමි.

......................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ....................................

02 - 667

---

**මතුගම ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

මතුගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් | වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 01 | PL1- (2006A) 11,730-120 x 10 130 x 10 - 145 x 10 160 x 12 17,600 (රු. 12,090 ට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය) | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත් විය යුතුය | |

02. මතුගම ප්‍රාදේශීය සභාවේ දැනටමත් අනියම්, ආදේශක හෝ ව්‍යාපෘති පදනම මත සේවය කරනු ලබන අයගේ අයදුම්පත් කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

03. වයස.- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18 ට නොඅඩු අවු. 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

04. වෙනත් සුදුසුකම්

(i) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ලාංකික පුරවැසියෙකු විය යුතුය ;
(ii) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය ;
(iii) අයදුම්කරු ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට බස්නාහිර පළාත් තුළ වසර 3 කට නොඅඩු කාලයක් තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය ; (ඡන්ද හිමි නාම ලේඛනයෙන් හෝ ග්‍රාම නිලධාරි/ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කල යුතුය.)
(iv) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ආයතන විසින් සේවයෙන් පහකරනු ලැබූ අයෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය ;
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ අධිකරණය මගින් දඬුවම් පමුණුවනු ලැබූ අයෙකු නොවිය යුතුය ;
(vi) අවශ්‍ය වුවහොත් සභාව විසින් නියම කරනු ලබන ඇපයක් මුදලින් හෝ රක්ෂණ සහතිකයක් මගින් තැබීමට සූදානම් විය යුතුය.

05. පොදු කොන්දේසි

(i) මනා පෞරුෂයකින් යුක්ත විය යුතුය ;
(ii) මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය ;
(iii) තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ය ;
(iv) පරිවාස කාලය අවසානයේ ස්ථිර කිරීම සලකා බලනු ලැබේ ;
(v) බඳවා ගැනීමෙන් පසුව ඔබ විසින් ඉදිරිපත් කර ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ වෙනත් සුදුසුකම් ව්‍යාජ හෝ අසත්‍ය බවට තහවුරු වුවහොත් වෙනත් කිසිම දැනුම් දීමකින් තොරව පත්වීම අවසන් කරනු ලැබේ.

06. *අයදුම්පත්.*- අයදුම්කරුවන් මෙම උපලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුව පිළියෙල කර ගත් අයදුම්පත් 2015.03.06 දිනට පෙර "ලේකම් ප්‍රාදේශීය සභාව - මතුගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ" අයදුම්කරන තනතුර" සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන හා තැපෑලේ දී නැතිවන අයදුම්පත් පිළිබඳව වගකියනු නොලැබේ.

07. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

08. අයදුම්පත් සමඟ පහත සඳහන් සහතික පත්වල පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය ;
(ආ) අධ්‍යාපන සහතිකය ;
(ඇ) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් සහතිකය/ඡන්ද නාම ලේඛනයේ පිටපත ;
(ඈ) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් ; (එකක් පදිංචි වසමේ ග්‍රාම සේවා නිලධාරිගෙන්)
(ඉ) වෘත්තීය පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික ;
(ඊ) දැනටමත් සේවයේ යෙදෙන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

09. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියළු බලතල මතුගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

10. බඳවා ගන්නා දිනට තිබෙන සියළුම පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලබන බැවින් ඉහත සඳහන් තනතුරුවල සංඛ්‍යාවන් වෙනස් වීමට ද ඉඩ තිබේ.

අසෝක රණසිංහ,
ලේකම්,

2015 ජනවාරි මස 21 වැනි දින,
මතුගම ප්‍රාදේශීය සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

මතුගම ප්‍රාදේශීය සභාව

**........... තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමඟ) : ————— ;
   මුලකුරුවලින් හැඳින්වෙන නම් : ————— ;

2. තැපැල් ලිපිනය : ————— ;

3. උපන් දිනය : අවුරුද්ද : ————— ; මාසය : ————— ; දිනය : ————— ;

4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු : ————— ; මාස: ————— ; දින : ————— ;

5. විවාහක/අවිවාහක බව : ————— ;

6. ජාතිය : ————— ;

7. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන්ද? යන වග : ————— ;

8. අධ්‍යාපන සුදුසුකම් : ————— ;

9. වෘත්තීය සුදුසුකම් : ————— ;

10. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් : ————— ;

    (i) දැනට දරන තනතුර : ————— ;
    (ii) එම තනතුරට පත් වූ දිනය : ————— ;
    (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/පදනම මත ද) : ————— ;

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

.........................................................................
අයදුම්කරුගේ අත්සන

දිනය : ..................................................

02 - 587

---

**කොලොන්නාව නගර සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

කොලොන්නාව නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු පිරවීම සඳහා අදාල සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (කොලොන්නාව නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් කොලොන්නාව නගර සභාවේ, ස්ථිර, ආදේශක, කොන්ත්‍රාත් හා ව්‍යාපෘති පදනම මත සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් අභ්‍යන්තර (සීමිත) | අධ්‍යාපන සුදුසුකම් බාහිර (විවෘත) | වෙනත් හා වෘත්තීය සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| 1 | රියදුරු II ආ | 1 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ. පො.ස. (සා. පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වීම (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05 ක් සමත්ව තිබිය යුතුය. | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වීම (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05 ක් සමත්ව තිබිය යුතුය.) | * පෞද්ගලික/කුලී රථ සහ තාරබර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකක් ලබා සිටිය යුතුය.<br>* වාහන රියදුරෙකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය. (සහතික මඟින් සනාථ කළ යුතුය.)<br>* අවම උස අඩි 05 ක් වත් විය යුතුය.<br>* දිවා කාලයේදී හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.<br>* මහාමාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. | රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860. 4 වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් හා නිපුණත්වය මැනීමේ පරීක්ෂණයක් මඟින්. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් අභ්‍යන්තර (සීමිත) | අධ්‍යාපන සුදුසුකම් බාහිර (විවෘත) | වෙනත් හා වෘත්තීය සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| 2 | සෞඛ්‍ය කම්කරු III | 8 | - | 8 වන ශ්‍රේණිය (9 වසර සමත් වී තිබිය යුතුය) | අදාළ නොවේ. | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 වසර 3 ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්. |
| 3 | පෙදරේරු III | 1 | (අ) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී, කුමන හෝ විෂයයන් 06 ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි./සහ ;<br>(ආ) මෙම තනතුරට අදාලව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.) | (අ) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී, කුමන හෝ විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි ; සහ<br>(ආ) මෙම තනතුරට අදාලව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.) | (අ) වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වන මට්ටමේ සහතිකය ලබා තිබීම ; හෝ<br>(ආ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; හෝ<br>(ඇ) ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහකිය ලබා තිබීම ; හෝ<br>(ඈ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; හෝ<br>ඉ. ජාතික ආධුනිකත්ව හා කාර්මික | රු. 12,470 - 10 x 130- 10 x 145 - 10 x160 - 12 x 170 - රු. 18,860 4 වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගින්. න්‍යායාත්මක දැනුම පරීක්ෂාව ලකුණු 100. .සමත් ලකුණු ප්‍රමාණය 40%. ප්‍රායෝගික පරීක්ෂණය ලකුණු 100. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් අභ්‍යන්තර (සීමිත) | අධ්‍යාපන සුදුසුකම් බාහිර (විවෘත) | වෙනත් හා වෘත්තීය සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| | | | | | පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA ) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; *හෝ*<br>(ඊ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම. | | |
| 4 | විදුලි කාර්මික III | 1 | (අ) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී හෝ අධ්‍යයනය පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී, කුමන හෝ විෂයයන් 06 ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි ; *හා*<br>(ආ) මෙම තනතුරට අදාලව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.) | (අ) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී, කුමන හෝ විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි ; *හා*<br>(ආ) මෙම තනතුරට අදාලව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.) | (අ) වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වන මට්ටමේ සහකිකය ලබා තිබීම ; *හෝ*<br>(ආ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; *හෝ*<br>(ඇ) ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; හෝ | රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860<br>4 වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගින්.<br>න්‍යායාත්මක දැනුම පරීක්ෂාව ලකුණු 100. සමත් ලකුණු ප්‍රමාණය 40%.<br>ප්‍රායෝගික පරීක්ෂණය ලකුණු 100. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් අභ්‍යන්තර (සීමිත) | බාහිර (විවෘත) | වෙනත් හා වෘත්තීය සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| | | | | | (ඈ) ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ; හෝ<br>(ඉ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හාදාර සහතිකය ලබා තිබීම ; හෝ<br>(ඊ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම. | | |
| 5 | බර යන්ත්‍රෝප කරණ ක්‍රියාකරු II | 2 | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම | ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේදී හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේදී. කුමන හෝ විෂයයන් දෙකක් සමත් වී තිබීම. | (අ) තාරබර හොණ්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් හා මගීන් 32 ට වඩා ගෙනයාමට බලපත්‍ර ඇති | රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 ඉහත වැටුප් පරිමාණයේ 12 වන පියවර ආරම්භක වැටුප් පියවර වේ. (4 | වාචික හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගින්.<br>මාර්ග නීති පිළිබඳව හා යාන්ත්‍රික ක්‍රියාකාරීත්වය පිළිබඳව වාචික |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් අභ්‍යන්තර (සීමිත) | අධ්‍යාපන සුදුසුකම් බාහිර (විවෘත) | වෙනත් හා වෘත්තීය සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| | | | | | බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය.<br><br>ආ. අවම උස අඩි 5 අඟල් 6 ක් විය යුතුය.<br><br>ඇ. බැකෝ ලෝඩර්, එස්කැවේටර්, මෝටර් ග්‍රේඩර්, ඩෝසර්, ලෝඩර්, දොඹකර යන බර යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳව රජයේ හෝ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු ප්‍රවීණතාවයක් ලබා තිබීම (පිළිගත් ආයතනය වශයෙන් රජයේ ආයතනයක්, පළාත් රාජ්‍ය ආයතනයක්, අර්ධ රාජ්‍ය ආයතනයක්, පළාත් පාලන ආයතනයක් හෝ රජයේ ලියාපදිංචි පුද්ගල ආයතනයක් හැඳින්වේ.<br><br>ඈ. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතුය. | වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | පරීක්ෂණය ලකුණු 100.<br><br>ප්‍රායෝගික ශිල්පීය හැකියාව හා ප්‍රවීණතාවය පරීක්ෂණය ලකුණු 100. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් අභ්‍යන්තර (සීමිත) | අධ්‍යාපන සුදුසුකම් බාහිර (විවෘත) | වෙනත් හා වෘත්තීය සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| 6 | ආදාහනාගාර ක්‍රියාකරු සහායක III | 1 | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම. | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම. | අදාළ නොවේ. | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 4 වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්. |
| 7 | ආදායම් පරීක්ෂක III | 1 | අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාවට සහ ගණිතය ඇතුළුව යටත් පිරිසෙයින් සම්මාන 2 ක් සහිතව විෂයයන් 06 කින් සාමාර්ථ ලබා තිබීම (මින් විෂයයන් පහ (05) ක් එක්වර සමත් වී තිබිය යුතුයි. | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය සමත්ව තිබීම සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. | අභ්‍යන්තර අයදුම්කරුවන් කොලොන්නාව නගර සභාවේ ප්‍රාථමික සේවා ගණයක වැටුප් ලබන සේවය ස්ථිර කර ඇති හා වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර මෙම කාලය තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබිය යුතුයි. | රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22,040. වසර 03 ක් ගතවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. | ලිඛිත විභාගයක් මගින්.<br>විවෘත විභාගය : අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය ලකුණු 100. සමත් ලකුණු ප්‍රමාණය 40% සාමාන්‍ය දීමනාව ලකුණු 100. සමත් ලකුණු ප්‍රමාණය 40%. සාමාන්‍ය දැනීම ලකුණු 100 සමත් ලකුණු ප්‍රමාණය 40%<br>සීමිත විභාගය :<br>සාමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්ෂණය ලකුණු 100. සමත් ලකුණු ප්‍රමාණය 40%. ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම ලකුණු 100. සමත් ලකුණු ප්‍රමාණය 40%. |
| 8 | සෞඛ්‍ය පරිපාලක III | 2 | අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාවට සහ ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 කින් සාමාර්ථ ලබා තිබීම (මින් විෂයයන්) පහ (05) ක් එකවර සමත් වී තිබිය යුතුයි. | (අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය සමත්ව තිබීම ; සහ<br>(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙළ) විභාගයේ දී | අභ්‍යන්තර අයදුම්කරුවන් කොලොන්නාව නගර සභාවේ PL 1 හා PL 2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහ (05) ක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, සේවා කාලය ආයතන | රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22,040 වසර 03 ක් ගතවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. | ලිඛිත විභාගයක් මගින්.<br>විවෘත විභාගය :<br>අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය ලකුණු 100. සමත් ලකුණු ප්‍රමාණය 40%. කාලීන සිදුවීම් පිළිබඳ |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් අභ්‍යන්තර (සීමිත) | බාහිර (විවෘත) | වෙනත් හා වෘත්තීය සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| | | | | අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. | ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතුය. | වසර 03 ක් ගතවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. | සාමාන්‍ය අවබෝධය ලකුණු 100 සමත් ලකුණු ප්‍රමාණය 40%<br><br>සීමිත විභාගය<br><br>සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ලකුණු 100 සමත් ලකුණු ප්‍රමාණය 40% ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම ලකුණු 100 සමත් ලකුණු ප්‍රමාණය 40% |
| 9 | වැඩ/ක්ෂේත්‍ර පරිපාලක II | 1 | අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාවට සහ ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබීම (මින් විෂයයන් පහ (05) ක් එක්වර සමත් වී තිබිය යුතුයි. | අ. සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය සමත්ව තිබීම ; සහ<br><br>ආ. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. | අභ්‍යන්තර අයදුම්කරුවන් කොලොන්නාව නගර සභාවේ PL 1 හා PL 2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහ (05) ක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතුය. | රු. 13,120 - 10 x 145 - 11 x 170- 10 x 240 - 10 x 320 - රු. 22,040 වසර 03 ක් ගතවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. | ලිඛිත විභාගයක් මඟින්<br><br>විවෘත විභාගය<br><br>අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය ලකුණු 100 සමත් ලකුණු ප්‍රමාණය 40% කාලීන සිදුවීම පිළිබඳ සාමාන්‍ය අවබෝධය ලකුණු 100 සමත් ලකුණු ප්‍රමාණය 40%<br><br>සීමිත විභාගය<br><br>සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ලකුණු 100 සමත් ලකුණු ප්‍රමාණය 40% ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම ලකුණු 100 සමත් ලකුණු ප්‍රමාණය 40% |

2. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය ;
(ii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය ;
(iii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය ;
(iv) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු 18 ත් 45 ත් අතර විය යුතුය. ආදායම් පරීක්ෂක, සෞඛ්‍ය පරිපාලක හා වැඩ ක්ෂේත්‍ර පරිපාලක තනතුර සඳහා අවු 30 ට නොවැඩි විය යුතුය ; (රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බළ පානු නොලැබේ.)
(v) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය ;
(vi) සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට හා ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ ;
(vii) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඩුවම් ලැබූවෙකු නොවිය යුතුය ;
(viii) රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු නොලැබූ අයෙකු විය යුතුය ;
(ix) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය ;
(x) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේ දී බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවා ගැනීමේ පටිපාටි ව්‍යවස්ථා සංශෝධන වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවා ගැනීම් ප්‍රමාද කිරීම්, වෙනස් කිරීම් සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කොලොන්නාව නගර සභාවේ ලේකම් සතුය.

3. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වේ.
(ii) බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයට යටත්වේ. ස්ථිර සේවකයින් එක් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ ; (රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය.)
(iii) මීට අමතරව ආයතන සංග්‍රහයේ විධි විධාන වලට ද, මුදල් රෙගුලාසි වලට ද, බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පනවනු ලබන වෙනත් නියෝග වලට ද දෙපාර්තමේන්තු නියෝග වලට ද අනුකූලව කටයුතු කල යුතුය.

4. අයදුම් කළ යුතු ආකාරය :

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (ඒ 4 ප්‍රමාණයේ) අයදුම්පතක් සකස් කර, අයදුම්පත්‍රය බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2015.03.06 දිනට පෙර ලේකම්, කොලොන්නාව නගර සභාව, කොලොන්නාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමග පහත සඳහන් ලියවිලිවල පිටපත් එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතික ;
(iii) ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ;
(iv) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය සනාථ කිරීමේ සහතිකය ;
(v) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික ;
(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික ;
(vii) මෑතක දී ලබා ගත් චරිත සහතික දෙකක් ;(මින් 01 ක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතුය.)
(viii) පොලිස් වාර්තාව.

5. පුරප්පාඩු සංඛ්‍යාව අනුව සම්මුඛ පරීක්ෂණයට, ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයට කැඳ වූ පමණින් ඔබ පත්වීමක් ලැබීමට සුදුස්සෙකු ලෙස නොසැලකිය යුතුය.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියළුම කරුණු පිළිබඳව අවසන් තීරණය කොලොන්නාව නගර සභාවේ ලේකම් සතු වන්නේ ය.

ගීතානි ඩී. ලොකුවැල්ල,
ලේකම්,
කොලොන්නාව නගර සභාව.

2015 ක්වු පෙබරවාරි මස 06 වැනි දින,
කොලොන්නාව නගර සභාවේ දී ය.

## ආදර්ශ අයදුම් පත්‍රය

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොලොන්නාව නගර සභාවේ ................................ තනතුර සඳහා බඳවා ගැනීම*

1. (අ) මුලකුරු සමග නම : ———— ;
   (ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් : ———— ;

2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ———— ;

3. ස්ථිර ලිපිනය : ———— ;

4. (අ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? : ———— ;
   (ආ) එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? : ———— ;

5. ජාතික හැඳුනුම්පත් අංකය : ———— ;

6. ස්ත්‍රී/පුරුෂ භාවය : ———— ;

7. විවාහක/අවිවාහක තත්ත්වය : ———— ;

8. දුරකථන අංකය : ———— ;

9. උපන් දිනය :
   වර්ෂය : ———— ; මාසය : ———— ; දිනය : ———— ;

10. 2015.03.06 දිනට වයස :

    වර්ෂ : ———— ; මාස : ———— ; දින : ———— ;

11. අධ්‍යාපන සුදුසුකම් (සමත්වූ විභාග පිළිබඳ විස්තර) : ———— ;

    11.1 අයදුම්කරු අවසන් වරට සමත් වූ පංතිය : ———— ;
    11..2 අ.පො.ස. (සා. පෙළ) විභාගය : ———— ;
    වර්ෂය : ———— ; මාසය : ———— ;
    විභාග අංකය : ———— ;
    ප්‍රතිඵල : ———— ;

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 5 | |
| 2 | | 6 | |
| 3 | | 7 | |
| 4 | | 8 | |

    11..3 අ.පො.ස. (උ. පෙළ) විභාගය
    වර්ෂය : ———— ; මාසය : ———— ;
    විභාග අංකය : ———— ;
    ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |

12. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

13. වෙනත් සුදුසුකම්

14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද?/නැත් ද යන වග : ———— ;

